තුන්වන පිටෙන්

## ආණ්ඩුවේ අසමත්කම........

පෙන්වීමට කරන උත්සාහයට උදව් කිරීමකි.

රාජපක්ෂලාගේ බොරු ප්‍රකාශ හා තදබල අසමත්වීම් හේතුවෙන් දරුස්මාන් වාර්තාව බිහිවී ආවේය. සියලු යුද්ධවලදී සිවිල් ජනයාට සිදුවන හානි අවම කිරීමට පියවර ගැනීමත්, එසේ සිදු වූ විට ඒ කනගාටුව පළ කර සමාව ගැනීමත්ය. එහෙත් රාජපක්ෂලා කළේ කිසිදු සිවිල් ජන හානියක් නුවූ බව ප්‍රකාශ කිරීමය. මෙය කිසිවකුත් විශ්වාස නොකරන අමූලික අසත්‍යයකි. පාලන පෙළැන්තිය සාධාරණ හා වගවීම පිළිබඳව සෑම තැනදීම නැවත නැවත පොරොන්දු වුවත් කළේ එහි අනික් පැත්තය. එකද මානව හිමිකම් කඩවීමක් ගැනවත් පරීක්ෂා කළේ නැත. මේ සුළු වැරදි ගැන ලෝකය එතරම් තැකීමක් නොකළත් යුද්ධයෙන් පසු සිංහලයන් ඉහළ නැග තමා කරන ක්‍රියා ගැන අවධානය යොමු කරනු ඇත. ලක්ෂ තුනක් දෙමළ සිවිල් ජනයා කඳවුරු තුළ කරන භාවාතිශය රංගනය දරුස්මාන් වාර්තාවේ දක්වා ඇති සත්‍යයක් යටපත් කිරීමකි. (බලවත්ම යුද වීරයා කොට තැබීමත් එල්ලා මරන බවට තර්ජනය කිරීමත් යෝග්‍ය දැයි සිතිය යුතු වේ.) ඉන් බොහෝ විට ඉල්ලා සිටින්නේ වන්නියේ සිවිල් වැසියන් ආරක්ෂා කිරීම, අතුරුදන්වීම් පරීක්ෂා කිරීම, හදිසි නීතිය ඉවත් කිරීම වැනි දේය. මේවා එකඟතා සාමයක් ඇති කර ගැනීමට අවශ්‍ය දේ වේ. එමෙන් ම, ප්‍රජාතන්ත්‍රවාදී අනාගතයක්, නැවත කොටි තර්ජනයක් බිහිවීම වැළැක්වීම සඳහා ද අත්‍යවශ්‍ය වේ. මේ නිර්දේශයන් පිළිගතහොත් හෝ ඒ ගැන එක්සත් ජාතීන් හා සාකච්ඡා කළහොත් අපේ රට උතුරු කොරියාව, මියන්මාරය, සිම්බාබ්වේ වැනි දුෂ්ට රාජ්‍ය ගණයට වැටීමෙන් ද වළකා ගත හැකි-වේ. එල්.ටී.ටී.ඊ.යට එරෙහි චෝදනා ගොනු කරන දරුස්මාන් වාර්තාව මෙසේ ද සඳහන් කරයි.
'මේ සියල්ල කරන ලද්දේ පැහැදිලිව පරදින යුද්ධය පවත්වා ගැනීමටය. එල්.ටී.ටී.ඊ.යේ අරමුණු වෙනුවෙ-න් සිවිල් වැසියන් රාශියකට දිවිදීමට සිදුවිය. එසේ කරන ලද්දේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ නායකත්වය රැක ගැනීමටය. ඊළාම් යුද්ධය තව දින දෙක තුනක් දිගු




ගාල් කර ගෙන සිටීම, හදිසි නීතිය ඉවත් නොක-රීම, 17 සංශෝධනය ක්‍රියාත්මක නොකිරීම, වාර්ගික ගැටලුවට දේශපාලන විසඳුමක් දෙන බව පෙන්නුම් නොකිරීම දරුස්මාන් වාර්තාව ගෙන ඒමට තත්ත්වය උදා කළේය.

අධිකරණ ක්ෂේත්‍රයේ මෑත දී කළ වැරදි ක්‍රියා දෙකක් මුක්තිය රාජපක්ෂලාගේ උපන්ගෙයි උරුමයක් ලෙස සලකන බව පෙන්නුම් කළේය. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන චන්දන කත්‍රිආරච්චිට එරෙහි වූ මිනීමැරීමේ චෝදනාව හා වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන දුමින්ද සිල්වාට එරෙහි බාල වයස්කාර දැරියක දූෂණය කිරීමේ චෝදනාව නීතිපති විසින් ඉවත් කර ගන්නා ලදී. අගවිනිසුරු බී.බී.සී.යට ප්‍රකාශ කළ ලෙසට නීතිපති විසින් සැකකරුවකුට එරෙහි අපරාධ චෝදනා ඉවත් කර ගැනීම වැරදි ක්‍රියාවකි. රාජපක්ෂලා දකුණේ ජනතාවට ලබා දෙන නීතියේ සාධාරණත්වය මෙබඳු නම් ඔවුන් උතුරට ලබා දෙන සාධාරණත්වය කෙබඳු වේදැයි සිතිය හැකිද?

වාර්ගික ගැටලුවට දේශපාලන විසඳුමක් දීමට පත් කළ සර්ව පාක්ෂික කොමිසමට වූ දේ පැහැදිලිය. සර්ව පාක්ෂික සමුළුව වාර්තාව ඉදිරිපත් කළ විට ජනාධිපති එය පිළිගත්තේ නැත. මෙය යුද්ධය අවසන් වනතුරු පවත්වාගෙන ගිය බොරු නාටකයකි. රාජපක්ෂ පාලනය යටතේ දේශීයව නීතියේ සාධාරණත්වය ඉටුවීම සිදු නොවන්නේ පවුලම සර්වකාලීන පරම බලයක් ලෙස මුක්තිය භාවිත කරන බැවිනි. පාලක පෙළැන්තිය යුද වීරයන් ජාත්‍යන්තර අධිකරණය ඉදිරියට යෑමෙන් බේරා ගැනීම ගැන කර ගැනීමට කොටි දෙමළ ජනයා බිලි දුන්හ.' දරුස්මාන් වාර්තාවට සැලකිය යුතු ප්‍රතිචාරයක් දැක්වීම සිදුවිය යුතු වුවද රාජපක්ෂලා ජාත්‍යන්තර ප්‍රජාවේ තමන්ගේ හිතවතුන් යොදා ගෙන අනවශ්‍ය ගැටුමක් ඇති කර තම පවුල් පාලනය රැක ගැනීමට කටයුතු කරන බැවින් එය සිදු නොවනු ඇත. ලංකා සමාජය තුළ තම පාලනය ශක්තිමත් කර ගැනීමේ තවත් පියවරක් උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් අතින් ප්‍රකාශයට පත් විය. 'විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමට තෝරා ගන්නා සියලු ශිෂ්‍යයන්ට නායකත්වය පුහුණුව සඳහා හමුදා ආයතන වෙත යැවෙනු ඇත. මැයි 23 ආරම්භ කැරෙන මෙයට සහභාගි වීම අනිවාර්ය වේ.'
(21-04-2011 අයිලන්ඩ්)

ප්‍රභාකරන් ඊළාම් යුද්ධ කළේ දෙමළ ජනයාට නිදහස ලබාදීමට නොව තමාට ඔටුනු පළඳා ගැනීමටය. රාජපක්ෂලා ශ්‍රී ලංකාව භයානක ගැටුම් තත්ත්වයකට යොමු කරන්නේ ජාතියේ ස්වෛරීත්වය සඳහා නොව, රාජපක්ෂ අධිපතිත්වය පවත්වා ගැනීමටය. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර කුණු ගොඩ තුළට වැටීමෙන් වළක්වා ගැනීමට රාජපක්ෂලා අප වෙත කාවද්දන බොරු දේශප්‍රේමයෙන් බේරී සිටීමට අප සමත් වේද?

පරිවර්තනය - හේමන්ත
(රාවය)




27

ප්‍රේමයේ උණුසුම් සුසුම් බිඳු
විසුරුවා ගිනි පුලිඟු අවුලා
නොතිත් ආශා සිහින සෑයේ
දල්වන්න ...
ලතැවෙන ප්‍රභාතය
ගෙන එන්න ...
ගෙන එන්න අරුණැල්ල
සොඳුරු ජීවනයේ ...

සැසැලෙන්න සිළුවක්
සිනාවක් වී
එදා අද කිසිදාක නොරැඳුනු
පහනක්ව හරිනා ...
කොඳුරමින් රහසින් ...
පතා මරණය ...
මිදී අඳුරින්
සදාකල් දැවෙනා ...
මගේ හදවත
නුඹේ ඉරණම ...
අඳුරමද සැමදා ...?

කම්කටොළු දුක් කටු අකුල්
කඳුළු මල් පොදි ගෙන ඇවිත්
අඳුර විනිවිද නෙත් යොමා
ඔබේ ඇරයුම අත දරා
සන් කරති දොරකඩ
අහඹු හමුවට
ආදරේ ...

අහස ගුලිවී අඳුරු යහනේ
වගුරනා කඳුලින් තෙමී
නිනඳ වේ හද
කැළඹිලා
අරුත නොහැඟෙයි
මන්ද සරයෙන්
ගැයෙන ගීයේ ඉකි ගැසී
සුලං රැලි මැද
මිමිණිලා

අහඹුවෙන් සිත සසලවා
මේ කුලේ දැල්වී මිදී
දසත විසිරුන රිදී රැහැනේ
සැමිටි පහරින් රිදුන මා නෙත්
අඳුරු වී යන ඉසිඹුවේ ...

තනිව ගං තෙර අඳුරු මං පෙත
තනිව සරනෙමි සොය සොයා
රැයේ ආදර ගීත නාදය
ගලා එන ලිය ගොමුව
ඔබ වසනා

ඝන අඳුර ගල් පව්වක්ව නැගිලා බලයි
අහස ගුගුරයි මොරගසා
සුලං රැලි වැලපි වැලපී දුවයි
බිඳුනු අවපාතය පුරා ...

ගෙන එන්න අරුණැල්ල
දල්වන්න ප්‍රභාතය
ප්‍රේමයේ උණුසුම් සුසුම් බිඳු
විසුරුවා ගිනි පුලිඟු අවුලා
නොතිත් ආශා සිහින සෑයේ
දල්වන්න ...
ලතැවෙන ප්‍රභාතය
ගෙන එන්න
අරුණැල්ල
සොඳුරු ජීවනයේ ...

Light, oh where is the light? Kindle it with the burning fire of desire!

There is the lamp but never a flicker of a flame---is such thy fate, my heart? Ah, death were better by far for thee!

Misery knocks at thy door, and her message is that thy lord is wakeful, and he calls thee to the love-tryst through the darkness of night.

The sky is overcast with clouds and the rain is ceaseless. I know not what this is that stirs in me---I know not its meaning.

A moment's flash of lightning drags down a deeper gloom on my sight, and my heart gropes for the path to where the music of the night calls me.

Light, oh where is the light! Kindle it with the burning fire of desire! It thunders and the wind rushes screaming through the void. The night is black as a black stone. Let not the hours pass by in the dark. Kindle the lamp of love with thy life.

*රබින්ද්‍රනාත් තාගෝර්යන්ගේ ගීතාංජලී කාව්‍යයේ ඉංග්‍රීසි පරිවර්තනයේ පද්‍යයන්හි අනුවර්තනයකි.*

රන්සිරිමල් ප්‍රනාන්දු

රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම
සවස 6 සිට 8 දක්වා
FM 88.6

FM 94.1
ලක් මිහිර South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න